# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2307/21 - 2022 නොවැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2022.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය**

දෙවැනි සංශෝධනය

2017 අප්‍රේල් 07 දිනැති හා අංකඃ 2013/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද පහත I කොටසේ සඳහන් පරිදි සංශෝධිත වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසේ දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**එම්. ඒ. බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2022 නොවැම්බර් මස 10 වැනි දින.

**I කොටස**

සංශෝධන අංක 01-2021 දෙසැම්බර් 27 දින හා අංක 2260/12 *අතිවිශෙෂ ගැසට් පත්‍රය*

**II කොටස**

**උපලේඛනය - 06**

උපලේඛන 06 හි අනු අංක 02 යටතේ ඇති සටහන පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

*සටහනඃ* විභාගය සමත් වීම සඳහා එක් විෂයයකට අවම වශයෙන් 40% කට නොඅඩුව ලකුණු සංඛ්‍යාවක් ලබා ගත යුතුය. ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගයේ පළමුවැනි භාගයෙහි I හා II කාණ්ඩ ද, දෙවැනි භාගයෙහි II කාණ්ඩයෙහි (අ) කොටස ද, දෙවැනි භාගයෙහි II කාණ්ඩයෙහි (ආ) කොටස ද යන විෂයයන්ගෙන් සමත් වූවන් තෙවන කාර්යක්ෂමතා කඩඉමෙන් සමත් වූවන් ලෙස සලකනු ලැබේ.

EOG 11 - 0258

1A - G 38128 — 07 (2022/11)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.